**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) - 2019**

-----------------------------------------------------------------------

-ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අදියර I සඳහා 2014 නොවැම්බර් 05 දින එළැඹි අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර II සඳහා 2015 මැයි 28 දින එළඹි අංක 3221 එස් ආර් අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර III සඳහා 2015 දෙසැම්බර් 11 දින එළඹි අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර IV සඳහා 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො.මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් බහු අදියර ණය පහසුකම් යටතේ අදියර 06 කින් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි.එම බහු අදියර ණය අදියර 06 යටතේ වෙන වෙනම ණය ගිවිසුම් 04 ක් රු.මිලියන 72,410 කට සමාන එ.ජ.ඩො.මිලියන 557 ක් මූල්‍යායනය කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට අත්සන් කර තිබූ අතර, අනෙක් ණය ගිවිසුම් රු.මිලියන 31,590 කට සමාන එ.ජ.ඩො.මිලියන 243 ක් මූල්‍යායනය කිරීම සඳහා 2018 හා 2020 වර්ෂවලදී අත්සන් කිරීමට නියමිතය. ඉහත සඳහන් කල අදියර 4 න්, අදියර 3 හි අංක 3222 එස්ආර්අයි (එස්එෆ්) සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) දරණ ණය ගිවිසුම් 2017 අප්‍රියෙල් 07 සහ 2017 මාර්තු 27 දින පිළිවෙලින් වසා දමා තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 13,780 කට සමාන එ.ජ.ඩො.මිලියන 106 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් මූල්‍යානය කිරීමට නියමිතය. වැඩසටහන එහි කටයුතු 2014 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 මාර්තු 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතී වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. වැඩසටහන විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම අරමුදල් ලැබීම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් ඊට සම්බන්ධ වගකීම් දරණ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------------- | --------- | --------------------- | ------------- |
| (අ) | උතුරුමැද, සබරගමුව,වයඹ සහ මධ්‍යම පළාත්වල සම්පූර්ණ කරන ලද පැකේජ වලට අයත් ප්‍රමාණපත් යටතේ මිලදී ගත් ඇතැම් ස්ථාවර වත්කම් 2019 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි. එසේවුවද, උතුරුමැද, සබරගමුව සහ වයඹ පළාත්වල සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පැකේජවලට අයත් රු.මිලියන 559.64 ක් වටිනා වාහන හැර අනෙක් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදුන් වත්කම්වල වටිනාකම් හඳුනාගැනීම සඳහා නිසි වාර්තා පවත්වාගෙන නොතිබුණි. එබැවින් භාරදුන් වත්කම්හි වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කෙරීගෙන යන වැඩ වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කෙරීගෙන යන වැඩියෙන් දැක්වීම . | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇති වත්කම් පිළිබඳ වාර්තා ව්‍යාපෘතිය සතුව තිබේ. මාර්ග සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සමඟ සාකච්ඡා කර කමිටුවක් පත්කර ගැනීම මඟින් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමටද, ඒ අනුව ගිණුම්ගත කිරීමටද නියමිතය. | භාරදී ඇති වත්කම් වල වටිනාකම නිසිපරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | මෙම වැඩසටහන මඟින් ඉදිකරන ලද කි.මී. 2,009.75 ක දිගින් යුත් ග්‍රාමීය මාර්ග 613 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණද, ඒ සඳහා වන පිරිවැය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | ජංගම නොවන වත්කම් අඩුවෙන් දැක්වීම | තනි මාර්ග ඉදිකිරීමේ පිරිවැය නිවැරදිව ලබාදිය හැක්කේ ඉහත පවරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසුව පමණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව වත්කම් හඳුනාගත යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි 4.2 උපවගන්තිය | කොන්ත්‍රාත්තුවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා කොන්ත්‍රාත්කරු සිය වියදමින් කාර්යසාධන සුරක්ෂණ ලබාගත යුතු බවට සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි උපවගන්ති 4.2 යටතේ ඇති විධිවිධානවලට පටහැනිව, මාර්ග පුනරුත්ථාපන කටයුතු පිළිබඳ ප්‍රමාණපත් සකස්කිරීමේදී වෙනම ගෙවීම් අයිතමයන් ඇතුළත් කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්යසාධන සුරක්ෂණවල පිරිවැය ප්‍රතිපූර්ණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට අමතරව රු.මිලියන 608.6 ක් ගෙවා තිබුණි. තවද, එම මුදල කොන්ත්‍රාත්කරුවන්ගෙන් නැවත අයකරගැනීමට 2019 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට අමතර ප්‍රතිලාභයක් හිමිවීම | කොන්ත්‍රාත් පිරිනමන ලද්දේ ප්‍රමාණවත් අවම තක්සේරු කරන ලද කොන්ත්‍රාත් වටිනාකම මත පදනම්වය. මෙම මුදල අලාභයක් ලෙස සැලකිය නොහැක. කෙසේවෙතත්, 4.2 උපවගන්තිය යටතේ නැගෙනහිර, උතුරු සහ බස්නාහිර පළාත්වල කොන්ත්‍රාත් පැකේජයන්හි ප්‍රමාණපත් වලින් මෙම ගෙවීම් අයිතමය ඉවත් කරන ලදී. | වැඩිපුර ගෙවන ලද වටිනාකම් නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් කොන්දේසි 14.6 උපවගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කල යුතු අවම අන්තර්ගෙවීම් සහතිකය කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 1.5 කි. කෙසේවෙතත්, අතුරුගෙවීම් සහතික ඇගයීමේදී පැකේජ 12 ක් යටතේ අවශ්‍ය සීමාවට වඩා අඩුවූ අවස්ථා 36 ක් නිරීක්ෂණය විය. | අතුරු ගෙවීම් සහතික ඇගයීම සඳහා පිරිවැය ඉක්මවා යාම. | කොන්ත්‍රාත්තුවේ ප්‍රතිපාදන අනිවාර්ය නොවන බැවින් කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රගතිය මත පදනම්ව ගෙවීම් නිර්දේශ කිරීමට | කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිවැය, කාලය සහ අනවශ්‍ය වාසි අවම කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ කොන්දේසියෙහි දක්වා ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සේවායොජකයා විසින් තීරණයක් ගන්නා ලදී. | |
| (ඇ) | සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි 14.10 උපවගන්තිය | උපවගන්ති 14.3 ට අනුව වැඩ පවරාගැනීමේ සහතිකය ලැබීමෙන් දින 84 ක් ඇතුළත කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කිරීමේ වාර්තාව අදාල උපකාරක ලියවිලි සමඟ ඉංජිනේරුවරයාට ඉදිරිපත් කල යුතුය. 2019 දෙසැම්බර් 31 දින වන විට කි.මී. 2,009.75 ක දිගින් යුත් මාර්ග 613 ක වැඩ අවසන් කර තිබූ නමුත් එවැනි සම්පූර්ණ කිරීමේ වාර්තා විගණනයට ලබාදී නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස නිම කරන ලද මාර්ගවල පිරිවැය නිශ්චය කිරීමට නොහැකි විය. | සම්පූර්ණ කරන ලද මාර්ගවල පිරිවැය නිශ්චය කල නොහැක. | නිම කිරීමේ ප්‍රකාශය සමඟ පවරා ගැනීම අවසන් වූ පසුව මාර්ගවල ඉදිකිරීමේ පිරිවැය සකස් කළ හැකිය. | මාර්ග පවරා ගැනීමෙන් අනතුරුව නිමකිරීමේ ප්‍රකාශය ලබාගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | උපදේශන ගිවිසුම 20 වන උපවගන්තිය | මාර්ග වැඩ නියෝජිත ආයතනවල නිළධාරීන්ගේ දැනුම හුවමාරු කිරීමේ සහ හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් මාර්ග සංවර්ධන අධිකාරියේ සහ (සබරගමුව, මධ්‍යම හා බස්නාහිර පළාත් සභාවල) ඉංජිනේරුවන් සහ කාර්මික නිළධාරීන් සාමූහිකව යෙදවීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, මාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා අදාල නියෝජිත ආයතනවල නිළධාරීන් වෙනුවට කොන්ත්‍රාත්කරුවන්ගේ තාක්ෂණික නිළධාරීන් වැඩසටහන මඟින් යොදවා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ සහ වෙනත් අදාල නියෝජිත ආයතනවල ඉංජිනේරුවන්ගේ සහ කාර්මික නිළධාරීන්ගේ දැනුම හා හැකියා වර්ධනය වැඩිදියුණු කිරීමේ අවස්ථාව එමඟින් අහිමිවේ. | දැනුම හුවමාරු කිරීමේ හා හැකියාව වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් ව්‍යාපෘතියේ ආරම්භක කාලසීමාව තුල අදාල පළාත්සභාවලින් ඉංජිනේරුවන් සහ කාර්මික නිළධාරීන් ව්‍යාපෘතියට මුදාහරින ලෙස ඉල්ලා තිබුණි. පළාත් සභාවලින් කිසිඳු ප්‍රතිචාරයක් නොලැබුණු හෙයින්, හදිසි වැඩබිම් අධීක්ෂණ කටයුතු ඉටුකිරීම සඳහා ඉංජිනේරුවන් සහ කාර්මික නිළධාරීන් සේවයේ යෙදවීමට | දැනුම හුවමාරුවෙන් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

උපදේශකයින්ට අවසර දෙන ලදී.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | ---------- | -------------------- | ---------- | ------------- | ----------- |
| (අ) | ජාතික මාර්ග පුනරුත්ථාපනය කිරීම | මූලික සැලසුම්වලට අනුව, දකුණ, මධ්‍යම, සබරගමුව, වයඹ, උතුරුමැද පළාත්වල සහ බස්නාහිර පළාතේ තළුතර දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 400 ක ජාතික මාර්ග සහ කිලෝමීටර් 3,117.62 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේවෙතත්, වැඩසටහනේ කාලසීමාව තුළ ප්‍රගති වාර්තාවන්ට අනුව ජාතික මාර්ග කිලෝමීටර් 400 න්, කිලෝමීටර් 25 ක් වූ ආර්එම්සී/03 පැකේජය යටතේ වූ මරදන්කඩවල - හබරන මාර්ගය සහ ආර්එම්සී - එස්පී 01 පැකේජය යටතේ කිලෝමීටර් 52 ක් වූ කරාපිටිය - ලබුදූව - තවලම මාර්ග පමණක් වැඩසටහන ආරම්භයේ සිට වසර 04 කට පසු සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රදානය කර තිබුණි. වැඩසටහනේ කාලය අවසාන වීමට පෙර ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමත් සමඟම ජාතික මාර්ගවල ඉතිරි කිලෝමීටර් 323 පුනරුත්ථාපන කටයුතු ආරම්භ කල හැකිද යන්න විගණනයට සැක සහිතය. | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් පිරිවැය ඉහළ යා හැකිය. | ප්‍රමුඛතා වෙනස්වීම්, මාර්ග ලැයිස්තු නිතර වෙනස් කිරීම හේතුවෙන් ජාතික මාර්ග මූලික සැලසුම් ලෙස ඉදිරියට ගෙන යා නොහැක. කෙසේවෙතත්, වැඩසටහන අවසන් වීමට පෙර අවම වශයෙන් කිලෝමීටර් 400 වැඩ නිමකිරීමට සැලසුම් කර ඇත. | මූලික සැලැස්මට අනුකූල වන පරිදි ග්‍රාමීය මාර්ග සමඟ ජාතික මාර්ගවල පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම | දකුණු, සබරගමුව, මධ්‍යම, උතුරුමැද, වයඹ පළාත්වල සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කි.මී. 2,651.06 ක පුනරුත්ථාපන කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර තිබුණි. ග්‍රාමීය මාර්ග කි.මී.2,651.06 ක් නිමකර තිබුණද, ග්‍රාමීය මාර්ග 613 න් කි.මී. 2,009.75 ක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. පැකේජ 42 ක් යටතේ වූ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 3,117.62 න් කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාල ග්‍රාමීය මාර්ග කි.මී.986.56 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් නොකර කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් පිරිවැය ඉහළ යා හැකිය. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වයන් හේතුවෙන් කොන්ත්‍රාත් 12 ක් කොන්ත්‍රාත් කොන්දේසිවල සඳහන් පරිදි නිසි ගිවිසුම්ගත පියවර ගෙන, අවසන් කිරීමට සිදුවී ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘතිය එම කොන්ත්‍රාත්වලින් 5 ක් සඳහා නැවත ලංසු කැඳවීමට පියවර ගෙන ඇති අතර අනෙක් කොන්ත්‍රාත් ඉදිරියට කරගෙන යාමට කොන්ත්‍රාත්කරුවන් අභිප්‍රාය පෙන්නුම් කර ඇත. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර නව ලංසුකරුවන්ගේ මූල්‍ය හා වැඩකිරීමේ හැකියාව නිසිලෙස ඇගයීමට ලක්කල යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | ---------------------- | --------- | -------------------------- | -------------------- |
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් එකතුව රු.මිලියන 146 ක විශේෂ ණය මුදලක් ලෙස ලබාගෙන ඇති අතර, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10 ක් ණය මුදලට අමතරව උපයෝජනය කර තිබුණි. තවද, මහා භාණ්ඩාගාරයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව, මහා භාණ්ඩාගාරයේ අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉහත සඳහන් රු. මිලියන 10 ක මුදල ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, 2018 දෙසැම්බර් 31 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබූ රු.මිලියන 136 ක අමතර අරමුදල්වල අවශ්‍යතාවය සහ ඒ සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවිණි. | අතිරේක අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීමේ හැකියාවක් ඇත. | 2019 ඔක්තෝම්බර් මාසයේ හදිසි ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයේ අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රු. මිලියන 10 ක මුදල මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන ඇති අතර ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති විසින් අනුමැතිය ලබාදී ඇත. අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇති දේශීය අරමුදල් ලැබීමෙන් පසු රු.මිලියන 10 මුදල මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවනු ලැබේ. මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගන්නා ලද ණය පහසුකම්වලින්, රු.මිලියන 136 ක විශේෂ ණය මුදල නිදහස් කර ඇත. නිරවුල් කිරීමේ | අතිරේක මූල්‍ය පහසුකම් වලකමින්, ණය මුදල උපරිම ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රියාවලිය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙහෙයවනු ලබන අතර, ව්‍යාපෘතියට අදාලව වූ සටහන් බේරුම්කරණ විස්තර ලැබෙන අයුරින් සටහන් කෙරේ. | |
| (ආ) | කොන්ත්‍රාත්කරුවන් 12 දෙනෙකු විසින් නීති ක්‍රියාමාර්ග ගෙන තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ බල මුළු ගැන්වීමේ අත්තිකාරම් වූ රු. මිලියන 3,734.79 ක් සහ කොන්ත්‍රාත්කරු විසින් රඳවාගෙන ඇති කාර්යසාධන බැඳුම්කර වටිනාකම වූ රු.මිලියන 2,618.47 ක මුදල අයකරගැනීමට වැඩසටහන කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් පරිපාලනය දුර්වල වීම නිසා පාඩු සිදුවිය හැකිය. | අයකර ගැනීම්වල බලපෑම අවසාන හිමිකම් ඉල්ලීම්වලදී බලපෑ හැකිය. කොන්ත්‍රාත් ප්‍රතිපාදන අනුව, බල මුළු ගැන්වීමේ අත්තිකාරම් සඳහා වන ඇපකර මුදල් කරගැනීම සඳහා වැඩසටහන විසින් කොන්ත්‍රාත්කරුවන් 12 දෙනෙකුට අදාල බැංකු වෙත ඉල්ලූ විට ගෙවීමේ ලිපි නිකුත් කර තිබුණි. කෙසේවෙතත්, අධිකරණ නියෝගය හේතුවෙන් මෙම ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා ඇත. | හිඟ මුදල් අය කරගැනීමට වැඩසටහන විසින් වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | වයඹ පළාතේ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගේ (කේයූ 03 සහ කේයූ 05) වැඩ අවසන් කිරීම හේතුවෙන් මාර්ග භාවිතයට ඇති අවධානම අවම කර ගැනීම සඳහා අවශ්‍ය හදිසි වැඩ කරවා ගැනීම වෙනුවෙන් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වූ (කේයූ 01) වෙත රු.මිලියන 92 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, අදාල කොන්ත්‍රාත්කරුවන්ගෙන් අමතර වියදම් අයකරවා ගැනීමට වැඩසටහන විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත් පරිපාලනය දුර්වල වීම නිසා පාඩු සිදුවිය හැකිය. | අවසන් කරන ලද කොන්ත්‍රාත් වන කේයූ 03 සහ කේයූ 05 හි හදිසි හා ආරක්ෂණ කටයුතු ක්‍රියාකාරී කොන්ත්‍රාත්කරුවෙකුට පැවරීම හේතුවෙන් දරන ලද අමතර වියදම්, කේයූ 03 සහ කේයූ 05 පැකේජ සඳහා වන "සේවායෝජකයන්ගේ හිමිකම්" සඳහා සම්පූර්ණයෙන්ම ඇතුළත් කර ඇත. | අදාල කොන්ත්‍රාත්කරුවන්ගෙන් දැරූ අමතර වියදම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | අත්හැර දමා ඇති වයඹ පළාතේ කේයූ 03, කේයූ 04, කේයූ 05, පීයූ 02, පීයූ 03 යන කොන්ත්‍රාත් පැකේජවල අනුයුක්ත සේවායෝජකයාගේ සහ ඉංජිනේරු කාර්යමණ්ඩලයේ වැටුප්, දීමනා, නිවාස සහ කාර්යාල පහසුකම් සහ වාහන නඩත්තුව සඳහා රු.මිලියන 23 ක් වෙනත් ක්‍රියාකාරී කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු විසින් විචලතා නියෝග මඟින් ගෙවා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු සඳහා සහභාගී නොවී දරන ලද මෙම පිරිවැය වැඩසටහනට අමතර පිරිවැයකි. | කොන්ත්‍රාත් පරිපාලනය දුර්වල වීම නිසා පාඩු සිදුවිය හැකිය. | ඉංජිනේරු සහ සේවායෝජකයාගේ ව්‍යාපෘති ප්‍රධාන කාර්යමණ්ඩලයේ සහ ඔවුන්ගේ පහසුකම් සැපයීම කොන්ත්‍රාත් පැකේජ අටක් මඟින් ලබාදී ඇති අතර ඒවා වයඹ පළාතේ තනි ව්‍යාපෘතියක් ලෙස සලකනු ලැබේ. එබැවින්, කාර්යමණ්ඩලය පොදුවේ සමස්ථ ව්‍යාපෘතිය පරිපාලනය හා කළමනාකරණය කරයි. නැතහොත් කොන්ත්‍රාත් පැකේජ | කාර්ය ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවසන් කිරීමෙන් පසුව වුවද සමහර කාර්යමණ්ඩල සහ පහසුකම් එම අවසන් කිරීමෙන් පසුව වන කටයුතු සඳහා අනිවාර්යයෙන් අවශ්‍ය වේ. එයට අමතරව, කාර්ය මණ්ඩලය අමතර යෙදවීමේ කාලසීමාවන් නිසා සේවායෝජකයාට අදාලව සියළු අතිරේක පිරිවැයද සේවායෝජකයාගේ හිමිකම්පෑමට ඇතුලත් කර ඇත. | |

**3.3 වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ**

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහනේ පළමු සංරචකයට අනුව, සියළු කාලගුණික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ග්‍රාමීය පිවිසුම් මාර්ග පුනරුත්ථාපනය කල යුතු අතර වසර තුනක කාලයක් නඩත්තු කල යුතුය. කෙසේවෙතත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේපැකේජ කේන්ද්‍ර 04 යටතේ වන කාසිකොටේ හන්දිය සිට මී ඔය පාලම හරහා පීල්ල මාර්ගය සහ නෙලුම්පතුවැව සිට උඩුදිවුල්වැව මාර්ගයේ ඇස්ෆෝල්ට් මතුපිට ඇති සමහර ඉරිතැලීම්, සේදීයාම් හා ගිලීගොස් ඇති ස්ථාන 2019 නොවැම්බර් 27 වන දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. පසුව ඇතිවූ ගංවතුර හේතුවෙන් මෙම මාර්ග සම්පූර්ණයෙන් විනාශවී තිබූ බව 2020 මැයි 13 දින නිරීක්ෂණය විය. එමනිසා, වැඩසටහන මඟින් සංරචකයේ පරමාර්ථ සපුරා නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ පරමාර්ථ ළඟාකර ගත නොහැක. | ඉදිකිරීම් වලින් වසරකට පසු දැඩි වියළි කාලපරිච්ඡේදයක් තුල ඇස්ෆෝල්ට් මතුපිට සමහර ඉරිතැලීම් දක්නට ලැබුණි. 2019 දෙසැම්බරයේ අධික තීව්‍රතාවයකින් යුත් අනපේක්ෂිත වර්ෂාව හේතුවෙන් මාර්ග අංක 16 හා 96 මාර්ගවල සමහර කොටස් ජලයෙන් යටවිය. එම මාර්ගවල නිරීක්ෂණය වූ සමහර ඉරිතැලීම් සහ සෝදායාම් ඉංජිනේරුවරයාට වාර්තා කළෙමු. මෙම හානි සිදුවන විට, කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. සජීවී කොන්ත්‍රාත්තුවක් නොතිබූ හෙයින් කොන්ත්‍රාත්කරු තමාගේ වියදමින් හෝ රක්ෂණ ආවරණයක් හරහා හානි නිවැරදි කිරීමට අපට අවස්ථාවක් නොතිබුණි. කෙසේවෙතත්, සැලසුම්වල සම්පූර්ණ වගකීම කොන්ත්‍රාත්කරු සතුව ඇති හෙයින් සහ අවසන් කරන ලද කොන්ත්‍රාත්කරු හරහා නිවැරදි කිරීමට නොහැකි වීම නිසා, හානියට පත් මාර්ග කොටස් වලට අදාලව කලින් ගෙවා ඇති සියළුම ගෙවීම් අවසන් කිරීමේ වටිනාකමින් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අඩු කරනු ලැබේ. ඊට අමතරව, සේවායෝජකට විය හැකි අමතර පිරිවැයද සේවායෝජකයාගේ හිමිකම්පෑමට ඇතුලත් කර ඇත. | ඉදිකිරීම් ගැටළු නිවැරදි කිරීමට සහ මාර්ගවල ගුණාත්මකභාවය සහතික කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැකේජ 01 යටතේ වන කි.මී.7.5 ක දිගින් යුත් මාවෙල හන්දිය සිට ඉලක්පිටිය හරහා තෙලිබැව පන්සල මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇතත්, ප්‍රමාණ පත්‍ර වල පාලම් ප්‍රතිසංස්කරණය සඳහා වන ප්‍රතිපාදන ඇතුලත් කර නොතිබුණි. පාලම් ප්‍රතිසංස්කරණය කිරීමට අපොහොසත්වීම හේතුවෙන් සමස්ථ මාර්ගයේම ගුණාත්මකභාවයට අහිතකර ලෙස බලපා තිබුණි. | ව්‍යාපෘතියේ පරමාර්ථය ළඟාකර ගත නොහැකිය. | පාලම් ඉදිකිරීමේ අයිතම කේයූ 01 ප්‍රමාණ පත්‍ර වල ඇතුලත් කර නොමැත. එහෙත් මාර්ග අංග 33, 4+814 ස්ථානයේ පිහිටි විශාල වශයෙන් අබලන්වූ පරතරයන් 3 ක් සහිත පාලම, මාර්ග භාවිතා කරන්නන්ගේ පහසුව සහ ආරක්ෂාව සඳහා ව්‍යාපෘතියේ අවසාන අවධියේදී පැවති ඉතිරිකිරීම් භාවිතා කරමින් සුදුසු පරිදි සකස් කරන ලද මිළ ගණන් මත ඉදිකරන ලදී. | ඉදිකිරීම් ගැටළු නිවැරදි කිරීමට සහ මාර්ගවල ගුණාත්මකභාවය සහතික කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.4 පරිබාහිර ගෙවීම්

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------------------ | ---------- | ------------------------------ | ----------------------- |
| ලැබුණු තොරතුරුවලට අනුව, ඇතැම් කොන්ත්‍රාත්කරුවන්ගේ මන්දගාමී ප්‍රගතිය සහ සේවා අවසන් කිරීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් සඳහා 2019 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 1,180.44 ක කැපකරු ගාස්තු ණය දෙන ආයතනයට ගෙවා තිබුණි. | වෙන් කිරීම අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගැනීම. | ණය ගිවිසුම අනුව උපයෝජනය නොකල ශේෂයන් මත කැපකරු කොමිස් ණය බලපැවැත්වෙන දිනෙන් පසු අදාල වේ. | අනවශ්‍ය වියදම් අවම කිරීමට පියවර ගත යුතුය. |

### 3.5 පද්ධති සහ පාලනයන්

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------------------------ | --------- | ------------------------- | ------------- |
| 1981 අංක 03 දරණ රාජ්‍ය කොන්ත්‍රාත් පනතට අනුව දේශීය හවුල්කරුගේ සහයෝගයෙන් කොන්ත්‍රාත්තුවක් ලබා ගන්නා විදේශීය කොන්ත්‍රාත්කරු රාජ්‍ය කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් හි ලියාපදිංචි විය යුතුය. කෙසේවෙතත්, දේශීය කොන්ත්‍රාත්කරුගේ සහයෝගය ඇතිව වයඹ පළාතේ සහ කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නියැලී සිටින චීනයේ සහ ඉන්දියාවේ කොන්ත්‍රාත්කරුවන්ගේ සමාගම් 02 ක් ලියාපදිංචි කිරීම පිරික්සා බැලීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවර ගෙන නොමැත.කෙසේවෙතත්, | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේදී ගැටළු මතු වේ. | ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුව, ආසියානු සංවර්ධන බැංකු සාමාජික රටක ලියාපදිංචි කොන්ත්‍රාත් සමාගම්, කොන්ත්‍රාත්කරුවන් ලෙස තෝරාගෙන තිබුණි. | වගකිවයුතු පාර්ශවකරුවන් හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කඩිනම් පියවර ගත යුතු අතර චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමේදී නොසැලකිලිමත්කම සම්බන්ධයෙන් පියවර ගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාවය වැඩසටහන ආරම්භක අදියරේදී නිසි ලෙස ඇගයීමට ලක් නොකිරීම හේතුවෙන් වූ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කේයූ 03 සහ කේයූ 05 පැකේජ යටතේ ඇති අදාල කොන්ත්‍රාත්තු පසුව අවසන් කර තිබුණි. | | | අවශ්‍යය. |

## 3.6 පෙර විගණන වාර්තාවල පෙන්වා දෙන ලද නොවිසඳී පවතින කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ----- | ------------------- | --------- | ------------------------ | ------------------ |
| (අ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නිරතවී සිටි කොන්ත්‍රාත්කරුවකුට අත්තිකාරම් සුරක්ෂණයේ වටිනාකම රු. මිලියන 30.26 ක් ඉක්මවා, රු. මිලියන 304.23 ක් ගෙවා තිබුණි. තවද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් මෙම වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් වැඩසටහන විසින් ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට අනවශ්‍ය අනුග්‍රහයක් ලබා දීම සහ අත්තිකාරම් අය කර ගැනීම කළ නොහැකි වනු ඇත. | මෙය දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් අවසන් කරන ලද කොන්ත්‍රාත්වලින් එකක් වන අතර අවසන් කිරීමේ හිමිකම්පෑම සමඟ මෙම මුදල පියවා ගැනීමට පියවර ගනු ලැබේ. | මෙම වැඩිපුර ගෙවන ලද මුදල අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කටයුතුවල නිරතවී සිටි දේශීය කොන්ත්‍රාත්කරුවෙකු මාර්ග පුනරුත්ථාපන කටයුතු අවසන්වීමෙන් පසු එම යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රතිඅපනයනය කිරීමේ එකඟතාවයෙන් ආනයනය කර තිබූ රු. මිලියන 324 ක් වටිනා යන්ත්‍රෝපකරණ හා උපකරණ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 සැප්තැම්බර් 05 දින අංක TIP / TP / 08/53 / 2016-69 දරන චක්‍රලේඛයේ දැක්වෙන නිදහස් බදු සහන යටතේ අයුතු ලෙස ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් පැකේජවල දක්වා ඇති අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා එවැනි යන්ත්‍රෝපකරණ භාවිතය අධීක්ෂණය කිරීම සඳහා වැඩසටහන නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. තවද, එම පැකේජවල සිටින කොන්ත්‍රාත්කරුවන්ට ඔහුගේ කොන්ත්‍රාත්තු ඉටු කිරීමට නොහැකි වූ අතර එම භාණ්ඩ නැවත අපනයනය කර තිබේද නැද්ද යන්න පරීක්ෂා කිරීමට වැඩසටහන කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීම සහ චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කිරීම | ජාතික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සලකමින් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ කොන්ත්‍රාත්කරුවන් සඳහා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මෙම බදු සහනය ලබා දී ඇත. | මේ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |